#  ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1816/37 - 2013 ජූනි මස 28 වැනි සිකුරාදා - 2013.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී 14/2008.

**සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත**

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 27 වැනි සහ 28 වැනි වගන්ති සමග කියවිය යුතු 51 වැනි වගන්තිය යටතේ පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

සුසිල් ප්‍රේමජයන්ත,
පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය.

2013 ජූනි මස 12 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2013 අංක......... දරන සමුද්‍රීය පාරිසරික ආරක්ෂණ (මුහුදට ඉවත දැමීම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීමේ) නියෝග යනුවෙන් සඳහන් කරනු ලැබිය හැකි ය.

2. කිසිදු තැනැත්තකු විසින් -

(අ) යම් හානිකර ද්‍රව්‍යයන් ;

(ආ) පහත ද්‍රව්‍යයන් ඇතුළු I වැනි උපලේඛනයේ සඳහන් කරන ලද යම් දූෂක ද්‍රව්‍යයන් :-

(i) (II) වැනි උපලේඛනයේ සඳහන් කරන ලද කැනීම් කරන ලද ද්‍රව්‍ය, මල අපවහන ගොහොදු, මත්ස්‍ය අපද්‍රව්‍ය හෝ කාර්මික ධීවර සැකසුම් ක්‍රියාවලිය හේතුවෙන් ඇතිවන ද්‍රව්‍ය ;

(ii) නිෂ්ක්‍රීය, අකාබනික, භූ විද්‍යාත්මක ද්‍රව්‍ය, ස්වභාවික ප්‍රභවයන් ඇති කාබනික ද්‍රව්‍ය ;

(iii) යකඩ, වානේ, කොන්ක්‍රීට් සහ සමාන හානිකර නොවන ද්‍රව්‍ය මූලික වශයෙන් අඩංගු දේවල් ;


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(iv) නැව්, ගුවන් යානා, වේදිකා හෝ වෙනත් මිනිසා විසින් සාදන ලද ව්‍යූහයන් ; සහ

(v) මෙම නියෝගවල III වැනි උපලේඛනයේ සඳහන් කරන ලද අපද්‍රව්‍ය.

අධිකාරිය විසින් තත්කාර්යය සඳහා නිකුත් කළ අවසර පත්‍රයක අධිකාරි බලය යටතේ හැර ශ්‍රී ලංකා දේශීය ජල තීරයට හෝ වෙනත් යම් සමුද්‍රීය කලාපයකට, එහි පෙර වෙරළ කලාපයට සහ ශ්‍රී ලංකා වෙරළ කලාපය තුළට ඉවත නොදැමිය යුතු ය.

3. මෙම නියෝගවල IV වැනි උපලේඛනයේ සඳහන් කරන ලද ද්‍රව්‍ය ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයට හෝ වෙනත් යම් සමුද්‍රීය කලාපයකට, එහි පෙර වෙරළ සහ ශ්‍රී ලංකා වෙරළ කලාපය තුළට ඉවත දැමීම අධිකාරිය විසින් තහනම් කරනු ලැබිය යුතු ය.

4. (1) ඉවත දැමීම සඳහා වන අවසර පත්‍රය සඳහා වූ ඉල්ලුම්පත්‍රයක් මෙම නියෝගවල V වැනි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන ලද ආකෘතියකින් අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) 4 වැනි නියෝගයේ (1) වැනි ඡේදය යටතේ ඉදිරිපත් කළ සෑම ඉල්ලුම් පත්‍රයක් ම -

(අ) VI වැනි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන ලද ඉල්ලුම් පත් ගාස්තුව ;

(ආ) අධිකාරිය විසින් අනුමත කළ හෝ පිළිගනු ලබන යම් ආයතනයක් විසින් ඉවත දැමිය යුතු ද්‍රව්‍ය පිළිබඳව ලබාදෙනු ලබන පරීක්ෂණ සහතිකයක් හෝ විශ්ලේෂණ වාර්තාවක් ;

(ඇ) ඉවත දැමිය යුතු යයි යෝජනා කරන ද්‍රව්‍යයක සාම්පලයක් ;

(ඈ) ඉවත දැමීම හැර බැහැර කිරීමට පවතින විකල්ප ක්‍රම පිළිබඳ තක්සේරුවක් ;

(ඉ) ඉවත දැමිය යුතු හානිකර ද්‍රව්‍ය හෝ දූෂක ද්‍රව්‍ය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් සහ චරිතායනයක් ;

(ඊ) ඉවත දැමීමට යෝජිත ස්ථානය සහ ඉවත දැමීම ක්‍රියාත්මක වීමට යෝජිත දිනය, වේලාව හා කාලසීමාව පිළිබඳ තොරතුරු ;

(උ) ඉවත දැමීමට යෝජිත ද්‍රව්‍යවල තත්ත්වය, ස්වභාවය සහ ප්‍රභවය පිළිබඳ විස්තර ;

(ඌ) ඉවත දැමීමට යෝජිත ක්‍රමය ;

(එ) (I) සමුද්‍රීය, වෙරළ, වරාය, ධීවර හෝ මෝය බඩ කටයුතු ;

(II) ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය තුල හෝ වෙනත් යම් සමුද්‍ර කලාපයක හෝ වෙරළ සහ කොරල් පර ඇතුළුව පෙර වෙරළ කලාපයේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සහ සංචාරක ආකර්ෂණයන් සංරක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීම ;

(III) ප්‍රජා සෞඛ්‍ය සහ මනා පැවැත්ම ;

(IV) ජීවී සමුද්‍ර සම්පත් සහ වනජීවීන් ;

(V) නැව් යාත්‍රා කිරීම ;

කෙරෙහි යෝජිත ද්‍රව්‍ය ඉවත දැමීම මගින් ඇතිවන පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරු කිරීමක් ;

(ඒ) යෝජිත නියාමන වැඩසටහන පිළිබඳ විස්තර සහ නිකුත් කළ අවසර පත්‍රයට අනුකූලවීම සහ සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීමට පිළිගත යුතු ක්‍රියාපටිපාටිය පිළිබඳ විස්තර ;

(ඔ) යාත්‍රාව යාත්‍රා කරනු ලබන්නේ කුමන ධජයක් යටතේ ද යන්න ඇතුළුව ඉවත දැමීම සඳහා භාවිතා කිරීමට යෝජිත යාත්‍රාව පිළිබඳ විස්තර ;

(ඕ) වර්තමාන මුහුදු යෝග්‍යතා සහතිකය ; සහ

(ක) නල මාර්ග වලින් ඉවත දැමීම සම්බන්ධයෙන් වූ කාරණාවක දී, එහි පරිමාණය සහ මුදාහැරීමට යෝජිත අනුප්‍රමාණය ඇතුළුව ඒ නල මාර්ග වලට අදාළ වන විස්තර

සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(3) සෑම ඉල්ලුම්පත්‍රයක්ම යෝජිත ඉවත දැමීම ආරම්භ කිරීමට පෙරාතුව දින තිහක් ඇතුළත ලිඛිතව අධිකාරියට ඉදිරිපත් කළ යුතු ය.

(4) (අ) ඒ ඉල්ලුම් පත්‍ර ලැබුණු පසු අධිකාරිය විසින් සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දින හැර සෙසු දිනවල වැඩ කරන වේලාව තුලදී ඉල්ලුම් පත්‍ර සැකසිය යුතු ය.

(ආ) කිසියම් වැඩ කරන දිනයක ප. ව. 3.00න් පසුව ලැබෙන යම් ඉල්ලුම්පත්‍රයක් පසුව එළඹෙන වැඩ කරන දිනයේ ලැබුනු ඉල්ලුම්පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) අධිකාරිය විසින්, ඉවත දැමීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීමේ කාර්යය සඳහා ඉල්ලුම් පත්‍ර ඇගයීමේදී අධිකාරිය විසින් අවශ්‍ය යයි තීරණය කළ හැකි පරිදි යම් අතිරේක තොරතුරු සපයන ලෙසට, ඉල්ලුම්කරුට ලියවිල්ලකින් නියම කළ හැකි ය.

5 (1) අධිකාරිය විසින් -

(අ) පනතේ 29 වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව ; සහ

(ආ) ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය (IMO) හෝ ශ්‍රී ලංකාව හැර වෙනත් යම් රාජ්‍යයක ජාතික සමුද්‍රීය පරිසර ආරක්ෂණ සංවිධානයක් විසින් කලින් කලට නිකුත් කර ප්‍රකාශයට පත්කරනු ලැබිය හැකි ඉවත දැමීමට සම්බන්ධ වන්නාවූ වෙනත් යම් මාර්ගෝපදේශයන්ට යටත්ව, අවසර පත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක්ම ඇගයීම කළ යුතු ය.

(2) අධිකාරිය වෙත ඉල්ලුම්පත්‍රය ලැබී දින තිහක් ඇතුළත එහි තීරණය පිළිබඳව ඉල්ලුම්කරු වෙත අධිකාරිය විසින් දැනුම් දිය යුතු ය.

(3) ඉවත දැමීම සඳහා වන අවසර පත්‍රය සඳහා වන ඉල්ලුම් පත්‍රය පිළිගනු ලැබූවිට, ඉල්ලුම්කරු විසින්, මෙහි VI වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි අවසර පත්‍ර ගාස්තු ගෙවිය යුතු අතර අධිකාරිය විසින්, ශ්‍රී ලංකා දේශීය ජල තීරයේ හෝ වෙනත් යම් සමුද්‍රීය කලාපයක, එහි පෙර වෙරළ සහ ශ්‍රී ලංකා වෙරළබඩ කලාපය තුල සිටින ජීවී විශේෂයන්ගේ ආරක්ෂාව සැලකිල්ලට ගනිමින් අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් නියමයන් සහ කොන්දේසි වලට යටත්ව මෙහි VII වැනි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති අවසර පත්‍රය නිකුත් කළ යුතු ය.

(4) නිකුත් කළ සෑම අවසර පත්‍රයක්ම, ඉල්ලා සිටි විට අධිකාරිය වෙත හෝ අධිකාරිය විසින් තත්කාර්යය සඳහා බලය දෙන ලද යම් තැනැත්තකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

6. (1) එවැනි අවසර පත්‍රයක් ප්‍රදානය කිරීමේදී, ඒ දේශීය ජල තීරයේ හෝ වෙනත් යම් සමුද්‍රීය කලාපයක, එහි පෙර වෙරළ සහ ශ්‍රී ලංකා වෙරළබඩ කලාපයේ යම් ජීවී විශේෂයන්ට හානිකර විය හැකි හෝ ජලයේ ගුණාත්මකභාවයට බලපෑමක් හෝ යම් සමුද්‍රීය කටයුත්තක බිඳ වැටීමක් ඇතිවිය හැකි යයි අධිකාරියේ මතය වන අවස්ථාවක දී අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කර නොපමාව ඒ තීරණය පිළිබඳව ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු ය.

(2) අධිකාරියේ තීරණයෙන් අගතියට පත් යම් තැනැත්තකු විසින්, ඒ තීරණය පිළිබඳව තමා වෙත දැනුම් දෙනු ලැබුවේ යම් දිනයකදී ද ඒ දිනයේ සිට දින තිහක් ඇතුළත ඒ තීරණයට එරෙහිව සමුද්‍ර දූෂණ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

(3) (2) වැනි ඡේදය යටතේ ඉදිරිපත් කරන ලද අභියාචනය අනුව, ලේකම්වරයා විසින්,

(අ) අභියාචනයට අවසර දිය හැකි අතර ඒ අභියාචනය ඉදිරිපත් කරනු ලැබුවේ යම් අධිකාරියක තීරණයකට එරෙහිව ද, ඒ අධිකාරිය වෙත එකී අවසර පත්‍රය නිකුත් කරන ලෙස විධාන කළ හැකිය ; නැතහොත්

(ආ) අභියාචනයට අවසර නොදිය හැකිය.

(4) අධිකාරිය විසින් (3) වැනි ඡේදය යටතේ එයට නිකුත් කරන ලද යම් විධානයකට අනුකූලව කටයුතු කළ යුතු ය.

7. (1) අධිකාරිය විසින් සෑම අවසර පත්‍රයකම -

(අ) ඉවත දමනු ලැබිය යුතු හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් යම් දූෂක ද්‍රව්‍යවල ස්වභාවය, ප්‍රභවය සහ ප්‍රමාණය පිළිබඳව;

(ආ) ඉවත දමන ස්ථානයේ පිහිටීම පිළිබඳව;

(ඇ) බැහැර කිරීමේදී යොදා ගන්නා යම් බැහැර කිරීමේ කළමනාකරණ ශිල්පීය ක්‍රම ඇතුළුව ඉවත දැමීමේ ක්‍රමය පිළිබඳව;

(ඈ) ඉවත දමනු ලබන දිනය සහ වේලාව සහ ඉවත දැමිය යුතු හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් යම් දූෂක ද්‍රව්‍යවල පවතින දූෂණ කාරකයන් පිළිබඳ තොරතුරු;

(ඉ) ඒ ඉවත දැමීම කළ යුත්තේ බලයලත් නිලධරයකු ඉදිරිපිටදී නම් ඒ බලයලත් නිලධරයාගේ නම ; සහ

(ඊ) අධිකාරිය විසින් සුදුසු යයි සිතන යම් වෙනත් කොන්දේසි.

සෑම අවසර පත්‍රයකම නිශ්චිතව සඳහන් කළ යුතු ය.

(2) අධිකාරිය විසින් නිකුත් කළ සෑම අවසර පත්‍රයක්ම ඒ අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති කාර්යය සඳහා පමණක් එහි නිශ්චිතව සඳහන් කර ඇති දිනයේදී සහ කාලසීමාව තුළදී භාවිතා කරනු ලැබිය යුතු ය.

(3) 5 වැනි ඡේදයේ (3) වැනි අනු ඡේදය යටතේ නිකුත් කරන ලද කිසිදු අවසර පත්‍රයක් වෙනත් යම් තැනැත්තකුට පැවරීම කරනු නොලැබිය යුතු ය.

(4) අධිකාරිය විසින් -

(අ) අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබූ කිසියම් කොන්දේසියක් හෝ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කර ඇති අවස්ථාවකදී හෝ අධිකාරිය විසින් නිකුත් කරන ලද යම් විධානයක් හා අනුකූල නොවන අවස්ථාවකදී ;

(ආ) අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලද යම් තොරතුරු අසත්‍ය හෝ සාවද්‍ය නම් හෝ අදාළ තොරතුරු කිසිවක් යටපත් කර ඇති අවස්ථාවකදී,

දින තිහක කාලසීමාවක් සඳහා අවසර පත්‍රයක් අවලංගු කිරීම හෝ අත්හිටුවීම සිදු කරනු ලැබිය හැකිය.

එසේ වුවද, අවසර පත්‍රයක් අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට පෙරාතුව අවසර පත්‍රය නිකුත් කරනු ලැබූ තැනැත්තාට අධිකාරිය විසින් කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් සලසා දිය යුතු ය.

(5) අධිකාරිය විසින්, අවසර පත්‍රය නිකුත් කරන අවස්ථාවේදී හානිකර ද්‍රව්‍යයන්ගෙන් හෝ වෙනත් යම් දූෂක ද්‍රව්‍ය මගින් සිදුවන දූෂණවලින් ආරක්ෂා කිරීමට තීරණය කරනු ලබන විශේෂ ප්‍රදේශ නම් කරනු ලැබිය හැකි අතර, 2 වැනි නියෝගයේ සඳහන් කරන ලද ද්‍රව්‍යයන් ඒ ප්‍රදේශවල දී ඉවත දැමීම තහනම් කරනු ලැබිය යුතු ය.

8. (1) සෑම අවසර පත්‍ර දරන්නකු විසින්ම-

(අ) ඉවත දැමීමට පෙර ඉවත දැමිය යුතු හානිකර ද්‍රව්‍ය හෝ දූෂක ද්‍රව්‍ය උත්පාදනය කරන හෝ ගබඩා කරන හෝ අසුරන පරිශ්‍රයන්ට ප්‍රවේශ වීම සඳහා ;

(ආ) පිරියතකින්, උපකරණයකින් හෝ සම්බන්ධිත පද්ධතියක් හෝ ඒ මගින් පිට කරන, මුදා හරින හෝ තැන්පත් කරනු ලබන කිසියම් හානිකර ද්‍රව්‍යයක හෝ දූෂක ද්‍රව්‍යයක සාම්පල ලබා ගැනීම සඳහා ;

(ඇ) අදාළ වාර්තා පොත් හෝ ලේඛන පරීක්ෂා කර බැලීම සඳහා සහ ඒ පරීක්ෂණ කටයුත්තේදී පොත් හෝ ලේඛන කිසිවක පිටපත් ලබගැනීම සඳහා ;

(ඈ) බලයලත් නිලධරයා විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි පරිදි අදාළ ස්ථානයේ ඡායාරූප ගැනීම සඳහා ; සහ

(ඉ) ඉවත දැමීමට යෝජිත දූෂක ද්‍රව්‍යවල සාම්පල ලබා ගැනීමට.

අධිකාරියේ බලයලත් නිලධරයකුට අවසර ලබාදිය යුතු ය.

(2) සෑම අවසර පත්‍ර දරන්නකු විසින් ම,

(අ) පරිසර දූෂණය සහ උවදුර අවම කිරීමේ අරමුණින් ඇසුරුම් කිරීමේ හෝ ඉවත දැමීමේ ක්‍රියාවලියේදී කිසියම් තාක්ෂණයක් හෝ ක්‍රමවේදයක් භාවිත කිරීම සම්බන්ධයෙන් ;

සහ

(ආ) සමුද්‍රීය පරිසර දූෂණය සහ උවදුරු වැළැක්වීමේ හෝ අඩු කිරීමේ කාර්යය සඳහා වූ වෙනත් යම් තාක්ෂණික පියවර සම්බන්ධයෙන්,

අධිකාරිය විසින් කලින් කලට දැනුම් දෙනු ලබන යම් නියමයන් වලට අනුකූල විය යුතු ය.

(3) බලයලත් නිලධරයකු විසින් මේ නියෝගයේ (1)(ආ) වැනි අනුඡේදය යටතේ පරීක්ෂා කරන ලද සාම්පලයක් පිළිබඳ ලිඛිත වාර්තාවක් සකස් කළ යුතු අතර, ඒ වාර්තාව අවසර පත්‍රය සමග අවස්ථාවෝචිත පරිදි, නැවේ ප්‍රකට ස්ථානයක හෝ අධිකාරිය විසින් තීරණය කරනු ලබන වෙනත් යම් ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.

(4) සෑම අවසර පත්‍ර දරන්නකු විසින්ම හානිකර ද්‍රව්‍ය හෝ දූෂක ද්‍රව්‍ය ඉවත දැමීම නිම කිරීමෙන් පසු ඒ ඉවත දැමීමෙන් දින හතක් ඇතුළත හෝ අධිකාරිය විසින් කලින් කල නියම කරන අවස්ථාවකදී මෙහි VIII වැනි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි අධිකාරිය වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

(5) සෑම අවසර පත්‍ර දරන්නකුටම, අවසර පත්‍රයේ නියමයන් සහ කොන්දේසි යටතේ ක්‍රියාත්මක වන අතරතුරදී යම් අතිරික්ත තෙල් උතුරා යාමකට හේතු වූ යම් අනතුරක් හෝ සිද්ධියක් පිළිබඳව අධිකාරියට දැනුම් දීමට නියම කරනු ලැබිය යුතු ය.

9. (1) ඉල්ලුම්කරුවකු විසින්, 4(1) වැනි නියෝගයට අනුකූලව හදිසි අවස්ථාවකදී හානිකර ද්‍රව්‍ය හෝ දූෂක ද්‍රව්‍ය ඉවත දැමීම සඳහා හදිසි අවසර පත්‍රයක් ලබා ගැනීම සඳහා අධිකාරිය වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකිය.

(2) අධිකාරිය විසින්, 5 වැනි නියෝගයට අනුකූලව ඉල්ලුම්පත්‍රය ඇගයීමට ලක් කිරීමෙන් පසුව-

(අ) වෙනත් ප්‍රායෝගික විකල්පයක් සොයාගත නොහැකි අවස්ථාවකදී මිනිසුන්ගේ සෞඛ්‍යයට ආරක්ෂාවට හෝ සමුද්‍රීය පරිසරය සම්බන්ධයෙන් පිළිගත නොහැකි අවදානමක් ඇති වන්නා වූ හදිසි තත්ත්වයකදී ඉවත දැමීමට අවශ්‍ය වන්නාවූ විට ;

(ආ) ඉවත දැමීමෙන් බලපෑම් ඇතිවිය හැකි ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් සුදුසු බලයලත් අධිකාරියක් සමග අධිකාරිය විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි පරිදි යම් විමසීමක් කිරීමෙන් පසුව ;

(ඇ) හදිසි අවසර පත්‍ර ඉල්ලුම්පත්‍රය පිළිබඳව ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයට දැනුම් දීමෙන් පසුව ; සහ

(ඈ) සමුද්‍රීය පරිසරයට හානි සිදුවීම වැළැක්වීම පිණිස සුදුසු ක්‍රියා පටිපාටි නිසි පරිදි අදාළ කර ගැනීම තහවුරු කිරීම පිළිබඳ ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේ (IMO) සහ වෙනත් යම් ජාත්‍යන්තර සංවිධානවල නිර්දේශ සැලකිල්ලට ගනිමින්,

හදිසි අවසර පත්‍රයක් නිකුත් කල යුතු ය.

(3) (2) වැනි අනුඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, අධිකාරිය විසින් හදිසි ඉවත දැමීම් සඳහා අවසර පත්‍ර ලබාදීමේ දී ජාතික යහපත සැලකිල්ලට ගතයුතු අතර, කොඩිය අයත් රාජ්‍යයේ හා වෙනත් යම් තැනැත්තෙකුගේ හෝ රාජ්‍යයක අයිතිවාසිකම් වලට ඉන් අගතියක් නොවිය යුතු ය.

10. පනතේ 27 වැනි වගන්තියේ හා 53 වැනි වගන්තියේ විධිවිධාන-

(අ) අවසර පත්‍රයක් ලබා ගැනීමෙන් තොරව යම් ඉවත දැමීමක් සිදු කරනු ලබන විට ; හෝ

(ආ) මෙම නියෝගවල යම් උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන්,

අදාළ විය යුතු ය.

11. මෙම නියෝගවල-

"පනත" යන්නෙන් 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත අදහස් වේ.

"අධිකාරිය" යන්නෙන්, ශ්‍රී ලංකා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය අදහස් වේ.

"ඉවත දැමීම" යන්නෙන් (අ) අපද්‍රව්‍ය හෝ වෙනත් ද්‍රව්‍ය සම්බන්ධයෙන්, එහි හිතාමතා කරන ඉවත් කිරීම් ; සහ

(ආ) නැවක්, ගුවන් යානයක් හෝ අක්වෙරළ ඉදිකිරීමක් සම්බන්ධයෙන් එහි හිතාමතා කරන ඉවත්කිරීම් හෝ අත්හැර දැමීම්.

අදහස් වන නමුත්, යම් අපද්‍රව්‍ය හෝ වෙනත් ද්‍රව්‍ය ඉවත් කිරීම හෝ ඒ ඉවත් කිරීම් සඳහා පිළියම් හෝ ප්‍රවාහනය කිරීම යම් නැවක, ගුවන් යානයක හෝ අක් වෙරළ ඉදිකිරීමක මෙහෙයුම්වලට ඇතුළත් කාර්යයන් නොවන්නේ නම්, නැවක, ගුවන් යානයක හෝ අක් වෙරළ ඉදිකිරීමක සාමාන්‍ය ක්‍රියාකාරිත්වයට ආනුශංගික වන හෝ එයින් ව්‍යුත්පන්න වන අපද්‍රව්‍ය හෝ වෙනත් ද්‍රව්‍ය බැහැර කිරීමක් ඇතුළත් නොවිය යුතු ය.

"හානිකර ද්‍රව්‍ය" යන්නෙන්, එවැනි ද්‍රව්‍යයක් මුහුදට දමනු ලැබුවහොත් මිනිසුන්ගේ සෞඛ්‍යයට අනතුරක් සිදුවීමට ඉඩ ඇති, ජීව සම්පත් වලට සහ සමුද්‍රීය ජීවීන්ට හානිකර විය හැකි, උපකරණවලට අලාභ සිදුවිය හැකි හෝ නෛතික ලෙස මුහුද භාවිතා කරන වෙනත් අවස්ථාවල බලපෑම් සිදුවිය හැකි යම් ද්‍රව්‍යයක් අදහස් වේ.

"අක් වෙරළ ඉදිකිරීම" යන්නෙන්, ඛනිජ ද්‍රව්‍ය කිසිවක් ගවේෂණය කිරීම සඳහා හෝ භාවිත කිරීම සඳහා හෝ ඒ ආශ්‍රිත ක්‍රියාවලියක් අරමුණු කරගෙන නැංගුරම්ලා ඇති හෝ සම්බන්ධ කර ඇති මුහුදු පත්ළ තුල හෝ මුහුදු පත්ළ මත භාවිතා කරන හෝ භාවිතා කිරීමට අරමුණු කරන (නැවක් නොවන පාවෙන ව්‍යුහයක් ඇතුළත්ව) යම් කෘත්‍රිම ව්‍යුහයක් අදහස් වන නමුත් නල මාර්ගයක් ඇතුළත් නොවිය යුතු ය.

"තැනැත්තා' යන්නෙන්, සේවා සපයන්නකු ලෙස ඉවත දැමීමේ කටයුතු කරගෙන යාමට තත්කාර්යය සඳහා අධිකාරිය විසින් ලියවිල්ලකින් බලය දුන් නැවක, අක් වෙරළ සවිකිරීමක හෝ නල මාර්ගයක අයිතිකරුවෙකු හෝ ක්‍රියාකරුවෙකු හෝ වෙනත් යම් තැනැත්තකු අදහස් වේ.

"විකිරණශීලී අපද්‍රව්‍ය හෝ වෙනත් විකිරණශීලී ද්‍රව්‍ය" යන්නෙන්, ශ්‍රී ලංකාවේ යහපතට හානිකර වන හා එරෙහි වන යම් විකිරණශීලී ද්‍රව්‍ය ඇතුළත් වන යම් අපද්‍රව්‍යයක් හෝ වෙනත් ද්‍රව්‍යයක් අදහස් වේ.

"ශ්‍රී ලංකා දේශීය ජල තීරය" යන්නට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

"අපද්‍රව්‍ය හෝ වෙනත් ද්‍රව්‍ය" යන්නෙන් යම් ස්වභාවයක, ආකාරයක හෝ විස්තරයක ද්‍රව්‍යයක් සහ ද්‍රව්‍යයන් අදහස් වේ.

1 වැනි උපලේඛනය

(2 (ආ) නියෝගය)

ඉවත දැමීමේ අවසර පත්‍රය යටතේ සමුද්‍රයට සහ මුහුදුබඩ ප්‍රදේශවලට ඉවත දැමීමට අවසර දී ඇති කාර්මික සහ ගෘහස්ථ අපද්‍රව්‍ය (පහත දැක්වෙන පරාමිතීන් ඔරොත්තු ධාරණ සීමාවට පහළ නම් පමණක් අවසර දිය යුතු ය.)

ගොඩබිමේ සිදුකරනු ලබන කර්මාන්ත සහ වෙනත් ප්‍රභවයන්ගෙන් සමුද්‍රයට සහ වෙරළබඩ ප්‍රදේශයන්ට බැහැර කිරීමේ ප්‍රමිතීන්

| අංකය | නිර්ණායකයන් | ඒකක හා සීමා | ධාරණ සීමා අගයන් |
|---|---|---|---|
| 01. | මුළු අවලම්බිත ඝන ද්‍රව්‍ය ප්‍රමාණය | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 150 |
| 02. | අංශු ප්‍රමාණය -<br>(අ) පාවෙන ඝන ද්‍රව්‍ය<br>(ආ) තැන්පත් වන ඝන ද්‍රව්‍ය | <br>මිලිමීටර්, උපරිම<br>මයික්‍රොමීටර්, උපරිම | <br>3.0<br>850 |
| 03. | පරිසර උෂ්ණත්වයේදී $P^H$ අගය | - | 5.5-9.0 |
| 04. | ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම (සෙ. $20^0$දී දින පහක් තුළ - $BOD_5$ හෝ සෙ. $27^0$ දින 3ක් තුළ $BOD_3$) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 100 |
| 05. | මුදා හැරීමේදී උෂ්ණත්වය | සෙ. අංශක, උපරිම | මුදා හරින ස්ථානයේ දී සෙ. $45^0$ |
| 06. | තෙල් වර්ග සහ ග්‍රීස් වර්ග | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 20 |
| 07. | පිනෝලික සංයෝග (පිනෝලික OH ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 5 |
| 08. | රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 250 |
| 09. | සම්පූර්ණ ශේෂ ක්ලෝරීන් | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 1.0 |
| 10. | ඇමෝනියා නයිට්‍රජන් (N ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 50 |
| 11. | සයනයිඩ් (CN ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.2 |
| 12. | සල්ෆයිඩ් (S ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 5.0 |
| 13. | ප්ලෝරයිඩ් (F ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 15.0 |
| 14. | ආසනික් (As ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.2 |
| 15. | කැඩ්මියම් (Cd ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 2.0 |
| 16. | සම්පූර්ණ ක්රෝමියම් ප්‍රමාණය (Cr ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 2.0 |
| 17. | ෂඩ් සංයුජ ක්‍රෝමියම් ($Cr^{6+}$ ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 1.0 |
| 18. | තඹ (Cu ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 3.0 |
| 19. | ඊයම් (pb ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 1.0 |
| 20. | රසදිය (Hg ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.01 |
| 21. | නිකල් (Ni ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 5.0 |
| 22. | සෙලිනියම් (Se ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.1 |
| 23. | සින්ක් (Zn ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 5.0 |

1 වැනි උපලේඛනය (සම්බන්ධිතයි)

| අංකය | නිර්ණායකයන් | ඒකක හා සීමා | ධාරණ අගයන් සීමා |
|---|---|---|---|
| 24. | පලිබෝධ නාශක | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.005 |
| 25. | කාබනික පොස්පරස් සංයෝග | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 1.0 |
| 26. | ක්ලොරිනිකෘත හයිඩ්‍රොකාබන (CI ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.02 |
| 27. | මළ අපද්‍රව්‍ය බැක්ටීරියා (කෝලි ආකාර) | ඉතා ආසන්න සංඛ්‍යාව/මිලි ලීටර්, උපරිම | 60 |
| 28. | විකිරණශීලී ද්‍රව්‍ය :<br>(අ) ඇල්ෆා විමෝචකයන්<br>(ආ) බීටා විමෝචකයන් | මයික්‍රෝ කියුරි/මිලි ලීටර්, උපරිම<br>මයික්‍රෝ කියුරි/ මිලි ලීටර්, උපරිම | $10^{-8}$<br>$10^{-7}$ |

**1 වැනි සටහන :** වර්ණය සහ අප්‍රසන්න දුර්ගන්ධය ඉවත් කිරීමට හැකිතාක් දුරට උත්සාහ කළ යුතු ය.

**2 වැනි සටහන :** මෙම අගයන් පදනම් වී ඇත්තේ අපසන්දන ජලය, ප්‍රතිග්‍රහණය කරන ජලය පරිමා 8කින් තනුක කිරීම මතයි. තනුකකරණය 8 වරකට වඩා අඩුනම් තනුකකරණය 8 වරක් වන ලෙස ධාරණ සීමාවන් සැකසිය යුතු වේ.

II වැනි උපලේඛනය

(2(ආ) (i) නියෝගය)

***මුහුදට ඉවත දැමීම සඳහා යෝජිත කැනීම් කරන ලද ද්‍රව්‍ය සඳහා වන අවසාදිත තත්ත්ව නිර්ණායක***

| අයිතමය | ද්‍රව්‍යය | පිරික්සුම් මට්ටම |
|---|---|---|
| | ලෝහ සහ ලෝහ ස්වරූප | |
| 1. | ඇන්ටිමනි | 2mg/kg |
| 2. | ආසනික් | 20mg/kg |
| 3. | කැඩ්මියම් | 1.5mg/kg |
| 4. | ක්රෝමියම් | 80mg/kg |
| 5. | කොපර් | 65mg/kg |
| 6. | ලෙඩ් | 50mg/kg |
| 7. | රසදිය | 0.15mg/kg |
| 8. | නිකල් | 21mg/kg |
| 9. | රිදී | 1.0mg/kg |
| 10. | සින්ක් | 200mg/kg |
| | කාබනික | |
| 11. | Total PCBs | 23μg/kg |
| | පලිබෝධනාශක | |
| 12. | ඩීඩීඩී | 2μg/kg |
| 13. | ඩීඩීඊ | 2.2μg/kg |
| 14. | සම්පූර්ණ ඩීඩීටී | 1.6μg/kg |
| 15. | ඩයල්ඩ්‍රින් | 0.02μg/kg |
| 16. | ක්ලෝඩේන් | 0.5μg/kg |

II වැනි උපලේඛනය (සම්බන්ධිතයි)

| *අයිතමය* | *ද්‍රව්‍යය* | *පිරිස්සුම් මට්ටම* |
|---|---|---|
| 17. | ලින්ඩේන් | 0.32µg/kg |
| 18. | එන්ඩ්‍රින් | 0.02µg/kg |
| | **පොලිනියුක්ලියර් ඇරෝමැටික් හයිඩ්‍රොකාබන් (PAH)** | |
| 19. | ඇසෙනප්තින් | 16µg/kg |
| 20. | ඇසෙනප්තලින් | 44µg/kg |
| 21. | ඇන්ත්‍රාසීන් | 85µg/kg |
| 22. | ප්ලෝරීන් | 19µg/kg |
| 23. | නැප්තලීන් | 160µg/kg |
| 24. | ෆේනැන්ත්‍රින් | 240µg/kg |
| 25. | PAH බර පහළ අංශු | 552µg/kg |
| 26. | බෙන්සො (අ) ඇන්ත්‍රසීන් | 261µg/kg |
| 27. | බෙන්සො(අ) පයිරීන් | 430µg/kg |
| 28. | ඩිබෙන්ස් (අ) ඇන්ත්‍රසීන් | 63µg/kg |
| 29. | ෆ්ලොරන්තීන් | 600µg/kg |
| 30. | ක්රිසීන් | 384µg/kg |
| 31. | පයිරීන් | 665µg/kg |
| 32. | PAHs බර ඉහළ අංශු | 1700µg/kg |
| 33. | PAH එකතුව | 10000µg/kg |
| | පෙට්‍රෝලියම් හයිඩ්රොකාබන් වෙනත් ද්‍රව්‍ය එකතුව | 550µg/kg |
| 34. | රේඩියෝනියුක්ලිඩ්ස් | 35 Bq/g |
| 35. | ට්‍රිබියුටයිල්ටින් | 9ng Sn/g |

III වැනි උපලේඛනය

(2(ආ)(v) නියෝගය)

1. පහත ලැයිස්තුවේ ඇති පදාර්ථයන් සැලකිය යුතු ප්‍රමාණයක් අඩංගු වන අපද්‍රව්‍ය ඃ

    1. ආසනික් සහ එහි සම්මිශ්‍රණ ;
    2. ලෙඩ් සහ එහි සම්මිශ්‍රණ ;
    3. තඹ සහ එහි සම්මිශ්‍රණ ;
    4. සින්ක් සහ එහි සම්මිශ්‍රණ ;
    5. ඓන්ද්‍රිය සිලිකන් සහ එහි සම්මිශ්‍රණ ;
    6. සයනයිඩ් ;
    7. ෆ්ලෝරයිඩ් ;
    8. බෙරිලියම්, ක්රෝමියම්, නිකල්, වැනඩියම් සහ ඒවායේ සම්මිශ්‍රණ ;
    9. මුහුදු ජලයේදී අහිතකර නොවන බවට වහාම පත්වන හානිකර නොවන ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍ය සහිත, 1 වැනි උපලේඛනයෙන් ආවරණය නොවූ පලිබෝධනාශක සහ ඒවායේ අතුරු නිෂ්පාදන මෙයින් නිදහස් කර ඇත.

2. පහළ මට්ටමේ විකිරණශීලී ද්‍රව්‍ය ඇතුළත් වන අපද්‍රව්‍ය.
3. ධීවර කටයුතුවලට හෝ යාත්‍රා කිරීම්වලට බරපතල බාධා ඇති කරනු ලැබිය හැකි හා මුහුදු පත්ලට ගිලී යා හැකි බහාලුම්, ලෝහමය සුන්බුන් හෝ වෙනත් අපද්‍රව්‍ය තොග.
4. 1 වැනි උපලේඛනයේ 1 වැනි සහ 2 වැනි අයිතමයේ සඳහන් ද්‍රව්‍ය ඇතුළත් මළ අපවහන ගොහොදු, අපද්‍රව්‍ය බවට පත්වූ කැනීම් කරන ලද ද්‍රව්‍ය.

## IV වැනි උපලේඛනය

(3 වැනි නියෝගය)

ඉවත දැමීම තහනම් කර ඇති ද්‍රව්‍ය.

1. ඕගනෝහැලජන් සංයෝග, මර්කරි සහ මර්කරි සංයෝග, කැඩ්මියම් සහ කැඩ්මියම් සංයෝග අඩංගු අපද්‍රව්‍ය. එහෙත් ඉහත ලැයිස්තු ගතකර ඇති ද්‍රව්‍යවල හුදු සලකුණක් වශයෙන් අන්තර්ගත වන සහ මුහුදු ජලයේදී අහිතකර නොවන බවට වහාම පත්වන ද්‍රව්‍ය නිදහස් කර ඇත ;

2. ඉහළ මට්ටමේ විකිරණශීලී අපද්‍රව්‍ය හෝ ඉහල මට්ටමේ විකිරණශීලී ද්‍රව්‍ය ;

3. දැවි තෙල් සහ ඒවායේ අපද්‍රව්‍ය, පිරිපහදු කල ඛණිජ තෙල් නිෂ්පාදන, ඛණිජ තෙල් ආසවන අවශේෂ හෝ එවැනි ද්‍රව්‍යවල යම් සංයෝගයක් ;

4. නාවික ගමන් සඳහා, මසුන් ඇල්ලීම සඳහා සහ වෙනත් ක්‍රියාකාරකම් හෝ සමුද්‍රීය ජීවීන් සඳහා අනතුරුදායක ලෙස බලපාන මුහුදේ පාවෙන හෝ මුහුදේ රැඳී තිබෙන්නාවූ දැල් හෙලීම, ලණු, ප්ලාස්ටික් හෝ වෙනත් කෘතිම රසායනික ද්‍රව්‍ය හෙලීම ;

5. මෙම උපලේඛනයේ 1 සහ 2 වැනි අයිතමවල සඳහන් ද්‍රව්‍ය අන්තර්ගත මළ අපවහන ගොහොදු සහ අපද්‍රව්‍ය බවට පත්වූ කැනීම් කරන ලද ද්‍රව්‍ය.

## V වැනි උපලේඛනය

(4(1) වැනි නියෝගය)

***මුහුදට ඉවත දැමීම සිදුකිරීම සඳහා වූ අවසර පත්‍රය සඳහා වන ඉල්ලුම් පත්‍ර ආකෘතිය***

අ. ඉල්ලුම්කරුගේ තොරතුරු :

පුද්ගලයාගේ හෝ සංවිධානයේ නම :.........................................

හදිසි අවස්ථාවකදී දැනුම් දිය යුතු තැනැත්තාගේ නම :..............................

ලිපිනය :......................................................................

දුරකථන අංකය :.........................................................

ෆැක්ස් අංකය :................................................................

ඊ-මේල් :.....................................................................................

ආ. අපද්‍රව්‍ය උත්පාදනය කිරීමේ ප්‍රභවය හෝ ක්‍රියාකාරකම (කරුණාකර ලකුණු කරන්න)

| | | |
|---|---|---|
| - | ගෘහස්ථ | |
| - | හෝටල් හෝ ආපනශාලා | |
| - | මත්ස්‍ය සැකසුම් | |
| - | බලාගාර | |
| - | රසායනික කර්මාන්ත | |
| - | හෝ වෙනත් ආකාරයේ කර්මාන්ත (නිශ්චිතව සඳහන් කරන්න) | |

V වැනි උපලේඛනය (සම්බන්ධිතයි)

| | |
|---|---|
| - සත්ව පාලනය හෝ කෘෂිකාර්මික ව්‍යවහාරයන් | |
| - ජලජීවී වගාව | |
| - වෙනත් | |

ඇ. ඉවත දැමීමට යෝජිත අපද්‍රව්‍යවල ප්‍රභවය සහ ස්වභාවය ඃ

ප්‍රභවය ඃ.................................................................

සංයුතිය ඃ.................................................................

ප්‍රමාණය සහ ගබඩා කරන ස්ථානය ඃ.................................................................

භෞතික ද්‍රව්‍ය පිළිබඳ විස්තර (කරුණාකර අදාළ ලේඛන ඇත්නම් අමුණන්න)

රසායනික ද්‍රව්‍ය පිළිබඳ විස්තර (කරුණාකර පරීක්ෂණ වාර්තා අමුණන්න)

ජෛව විද්‍යාත්මක ද්‍රව්‍ය පිළිබඳ විස්තර (කරුණාකර පරීක්ෂණ වාර්තා අමුණන්න)

කැනීම් කරන ලද ද්‍රව්‍ය සම්බන්ධයෙන් වන කාරණයකදී, අධිකාරියට පිළිගත හැකි අවසාදිත තත්ත්ව නිර්ණායක වලට එය අනුකූල වන්නේ ද යන්න ඃ.................................................................

යාත්‍රා සහ වේදිකා හෝ මිනිසා විසින් සාදන ලද ව්‍යුහයන්හි

* තෙල්
* රසායන ද්‍රව්‍ය සහ වෙනත් දූෂක ද්‍රව්‍ය, සහ
* ජලය මත පාවෙන සුන්බුන් ඇති කිරීමේ හැකියාවක් ඇති යම් ද්‍රව්‍යයක් හෝ
* සමුද්‍රීය පරිසර දූෂණය සිදු වීමට අන්‍යාකාරයෙන් දායක වන යම් ද්‍රව්‍යයක් උපරිම ප්‍රමාණයෙන් ඉවත් කරනු ලැබ ඇත්ද ? (කරුණාකර අදාළ ලේඛන, ඡායාරූප ආදිය අමුණන්න)

ඈ. යෝජිත ඉවත දැමීමේ ක්‍රියාවලිය ඃ

ඉවත දැමීමට යෝජිත ක්‍රමය ඃ.................................................................

ඉවත දැමීමට යෝජිත ක්‍රමය නල මාර්ගයක් මගින් සිදු කරයි නම් ඃ.................................................

නල මාර්ගයේ විෂ්කම්භය ඃ.................................................................

වෙරළේ සිට නල මාර්ගයේ දිග ඃ.................................................................

යෝජිත බැහැර කිරීමේ අනුපාතය ඃ.................................................................

නැවකින්, ගුවන් යානයකින් හෝ වේදිකාවකින් ඉවත දැමීම කරගෙන යාමට යෝජනා කර ඇත්නම්,

(අ) නම ඃ.................................................................

(ආ) ධජය ඃ.................................................................

(ඇ) IMO හඳුනාගැනීමේ හෝ ලියාපදිංචි කිරීමේ අංකය (නැතහොත් ඒ හා සමාන අංකයක්) ඃ.........................

(ඈ) නැවේ, ගුවන් යානයේ හෝ වේදිකාවේ අයිතිකරු ඃ.................................................................

(ඉ) ඉවත දැමීමට යෝජිත දිනය/දින ඃ.................................................................

V වැනි උපලේඛනය (සම්බන්ධිතයි)

(ඊ) බහුවිධ ඉවත දැමීමේ අවස්ථා යෝජනා කර ඇති අවස්ථාවකදී එක් එක් අවස්ථාවකදී ඉවත දැමිය යුතු ප්‍රමාණය :……………………………………………………………………

ඈ. යෝජිත ඉවත දැමීමේ ස්ථානය :

පිහිටීම (අක්ෂාංශ සහ දේශාංශ ඇතුළුව) (කරුණාකර පරිමාණ සටහන අමුණන්න) :……………………………………

මෙම ස්ථානය යෝජනා කිරීම සඳහා වන මූලික හේතු/යුක්තිසහගතභාවය :……………………………………

ජලයේ ගැඹුර :…………………………………

ආසන්නතම ගොඩබිමේ සිට ඇති දුර :…………………………………

ඒ ස්ථානයේ සහ එයට ආසන්නයේ පිහිටි ජෛව ප්‍රජා :……………………………………
(*උදා* :- කොරල්පර, මුහුදු තෘණ ආදිය)

ඒ ස්ථානයේ සහ ඒ ස්ථානයට ආසන්නයේ පිහිටි ධීවර සම්පත් :……………………………………

ප්‍රදේශයේ දැනට භාවිතය :……………………………………

ඉ. අපේක්ෂිත පාරිසරික බලපෑම්

යෝජිත ඉවත දැමීමේදී පහත දැක්වෙන දේවල් කෙරෙහි සෘජුව සහ වක්‍රව යන දෙයාකාරයෙන්ම කෙටිකාලීන සහ දිගුකාලීනව අපේක්ෂිත බලපෑම් මොනවාද ?

(*අ*) යෝජිත ඉවත දැමීමේ ස්ථානයේ සහ ස්ථානයට ආසන්නයේ සාගර පත්ලේ අවසාදිත තත්ත්වයට (භෞතික සහ රසායන) :……………………………………

(*ආ*) ඉවත දැමීමේ ස්ථානයේ සහ ස්ථානයට ආසන්නයේ ජලයේ තත්ත්වය : (භෞතික සහ රසායන) කෙසේද යන්න ?:…………………………………

(*ඇ*) යෝජිත ඉවත දැමීමේ ස්ථානයේ සහ එයට ආසන්නයේ ඇති ජෛව ප්‍රජාවන් කවරේද ?:……………………………………

(*ඈ*) ඉවත දැමීමේ ස්ථානයේ සහ එයට ආසන්නයේ ඇති ධීවර සම්පත් කවරේද ?:……………………………………

(*ඉ*) ඉවත දැමීමේ ස්ථානයට ආසන්නයේ ඇති වෙළඳ හෝ ධීවර යාත්‍රා සංචලනය වන සාමාන්‍ය ඝනත්වය සහ යෝජිත යාත්‍රා කිරීම් පිළිබඳ ආරක්ෂිත වැඩපිළිවෙලවල් :……………………………………

(*ඊ*) වෙනත් භාවිතා කිරීම් සහ ප්‍රදේශය භාවිතා කරන්නන් :……………………………………

ඉවත දැමීමේදී සිදුවිය හැකි යම් අහිතකර පාරිසරික බලපෑම් වැලැක්වීමට, පාලනය කිරීමට සහ නියාමනය කිරීමට ඉල්ලුම්කරු විසින් යෝජිත පියවරවල් පිළිබඳ විස්තර ඉදිරිපත් කරන්න.

:……………………………………………………………………

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සත්‍ය සහ නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව සොයාගනු ලැබුවහොත් මාගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලබන බවත්, බලපත්‍රය නිකුත් කර ඇත්නම් එය අවලංගු කරනු ලබන බවත් දැන සිටිමි.

…………………
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය : …………………

**කාර්යාලයීය භාවිතය සඳහා පමණි**

අවසර පත්‍ර ඉල්ලුම්පත්‍රයේ අංකය :-

1. ඉල්ලුම්පත්‍රය ලැබුනු දිනය :

2. ලැබුනු උපකාරක ලේඛනවල ලැයිස්තුව :

3. ඉල්ලා සිටි හෝ ලබාගත් යම් අතිරේක තොරතුරු කිසිවක් ඇත්නම් :

4. යම් නියෝජ්‍යායතනයක් වෙතින් ඉල්ලා සිටි හෝ ලබාගත් යම් නිරීක්ෂණයන් පිළිබඳ තොරතුරු :

5. අවසර පත්‍රය නිකුත් කලේද/නැත්ද යන්න ඔව්/නැත :

6. අවසර පත්‍රයක් නිකුත් කලේ නම් :-

   (අ) අවසර පත්‍ර අංකය ;

   (ආ) නිකුත් කල දිනය ;

   (ඇ) වලංගු කාලසීමාව ;

   (ඈ) ඉකුත් වන දිනය ;

   (ඉ) ඇතුළත් කොන්දේසි (කිසිවක් ඇත්නම්).

7. අවසර පත්‍රය ප්‍රතික්ෂේප කර ඇත්නම්, ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ හේතු :

බලයලත් නිලධරයාගේ අත්සන හා පදවි නාමය………………… දිනය…………………

VI වැනි උපලේඛනය

(4(2) වැනි නියෝගය)

**ගාස්තු**

**ඉල්ලුම් පත්‍ර ගාස්තු - රු. 1500.00**

**අවසර පත්‍ර ගාස්තු**

1. පදිංචිකරුවකු විසින් ගෘහස්ථ අපවිත්‍ර ජලය ඉවත දැමීම - වාර්ෂික බලපත්‍රය - රු. 5,000

2. හෝටලයක්, අවන්හලක් හා වෙනත් කර්මාන්ත මගින් අවුරුදු එකක කාලසීමාවක් තුල මළ අපවහන, අපවිත්‍ර ජලය, සිසිල් කරන ලද ජලය ඉවත දැමීමේදී,

   අ. කියුබික් මීටර් 10,000ට අඩු නම් - රු. 10,000
   ආ. කියුබික් මීටර් 10,000-50,000 අතර - රු. 20,000
   ඇ. කියුබික් මීටර් 50,000-1,00,000 අතර - රු. 30,000
   ඈ. කියුබික් මීටර් 100,000ට වැඩිනම් - රු. 50,000

3. කැනීම් කරන ලද ද්‍රව්‍ය, මළ අපවහන ගොහොදු, මත්ස්‍ය අපද්‍රව්‍යයන් හෝ මත්ස්‍ය සැකසුම් ක්‍රියාවලියේදී ඉතිරිවන ද්‍රව්‍යයන් ඉවත දැමීමේදී,

VI වැනි උපලේඛනය (සම්බන්ධිතයි)

අ. කියුබික් මීටර් 5000ට අඩු නම් - රු. 10,000
ආ. කියුබික් මීටර් 5,000-10,000 අතර - රු. 20,000
ඇ. කියුබික් මීටර් 10,000-20,000 අතර - රු. 30,000
ඈ. කියුබික් මීටර් 20,000-40,000 අතර - රු. 50,000
ඉ. කියුබික් මීටර් 40,000ට වැඩි හා ඊට වඩා වැඩිවන සෑම කියුබික් මීටර් 1000ක් සඳහා - රු. 5,000.00

4. ස්වභාවික ප්‍රභවයන් ඇති නිෂ්ක්‍රීය, අකාබනික, භූවිද්‍යාත්මක ද්‍රව්‍ය, වානේ, කොන්ක්‍රීට් හෝ සමාන හානිකර නොවන ද්‍රව්‍ය - මූලික වශයෙන් අඩංගු දේවල් ඉවත දැමීමේදී,

අ. ද්‍රව්‍ය වලින් කියුබික් මීටර් 1000ක් සඳහා - රු. 10,000
ආ. කියුබික් මීටර් 1000-5000 අතර නම් - රු. 10,000
ඇ. ද්‍රව්‍යවලින් කියුබික් මීටර් 5000-10,000 අතර නම් - රු. 20,000
ඈ. කියුබික් මීටර් 10,000ට වැඩිනම් සහ වැඩිවන සෑම කියුබික් මීටර් 1000ක් සඳහා - රු. 1,000.00

5. යාත්‍රා හෝ ගුවන් යානා හෝ මිනිසා විසින් සාදන ලද වෙනත් යකඩ ව්‍යුහයන් ඉවත දැමීමට, එක් අයිතමයක් සඳහා රු. 1,00,000

## VII වැනි උපලේඛනය

(5(3) වැනි නියෝගය)

***මුහුදට ඉවත දැමීම සඳහා වූ අවසර පත්‍රය***

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 27 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලදී.

අවසර පත්‍ර අංකය ………………

අ. අවසර පත්‍ර දරන්නාගේ තොරතුරු :

1. පුද්ගලයාගේ හෝ සංවිධානයේ නම :…………………………………………

2. ලිපිනය :…………………………………………

3. දුරකථනය :…………………………………………

4. ෆැක්ස් :…………………………………………

5. ඊමේල් :…………………………………………

ආ. ඉවත දැමීමට අවසර දෙන ලද අපද්‍රව්‍යවල ස්වභාවය :

6. ප්‍රභවය :…………………………………………

7. සංයුතිය :…………………………………………

8. ප්‍රමාණය :…………………………………………

9. විස්තර :…………………………………………

ඇ. අවසර දෙන ලද ඉවත දැමීමේ ක්‍රියාවලිය :

10. ඉවත දැමීමට අවසර දෙන ලද ක්‍රමය :…………………………………………

VII වැනි උපලේඛනය (සම්බන්ධිතයි)

11. යාත්‍රාවක්, ගුවන් යානයක් හෝ වේදිකාවක් මගින් (අදාළ නොවන වචන ඉවත් කරන්න) ඉවත දැමීම කරගෙන යනු ලබන්නේ නම් ෴

(අ) නම ෴..............................................

(ආ) ධජය ෴..............................................

(ඇ) IMO හඳුනාගැනීමේ හෝ ලියාපදිංචි කිරීමේ අංකය (නැතහොත් ඒ හා සමාන අංකයක්) ෴..................

(ඈ) ඉවත දැමීමට අවසර දී ඇති යාත්‍රාවේ, ගුවන් යානයේ හෝ වේදිකාවේ ( අදාළ නොවන වචන කපා හරින්න) අයිතිකරු ෴..............................................

12. ඉවත දැමීමට අවසර දී ඇති දිනයන් හා වේලාව හෝ කාලසීමාව (සිට/දක්වා) ෴..............................................

ඈ. ඉවත දැමීමේ ක්‍රියාකාරකම් සඳහා නල මාර්ගයන් භාවිත කරනු ලබන්නේ නම් ෴

(අ) නල මාර්ගයේ විෂ්කම්භය ෴..............................................

(ආ) නල මාර්ගයේ දිග ෴..............................................

(ඇ) උපරිම බැහැර කිරීමේ අනුපාතය ෴..............................................

ඉ. වලංගු කාලසීමාව ෴

13. මෙම අවසර පත්‍රය................................දින සිට ................................දක්වා වලංගු වන අතර අංක දරන මෙම අවසර පත්‍රය යටතේ එහි නිශ්චිතව සඳහන් කරන ලද දිනයකදී හැර ඉවත දැමීම් කරගෙන යනු ලැබිය නොහැකිය.

(ඊ) ඉවත දැමීම පිළිබඳ වාර්තාව ෴

14. ඉවත දැමීමේ ක්‍රියාවලිය අවසන් කරනු ලැබූවිට හෝ ඉවත දැමීමේ ක්‍රියාදාමය දින තිහකට වඩා වැඩි කාලයක් සිදු කරනු ලබන විට හෝ ඉවත දැමීමේ වාර්තාව අවස්ථාවෝචිත පරිදි, එසේ අවසන් කරනු ලැබූවිට හෝ ඊළඟ මාසයේ 10 වැනි දිනට පෙර අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය.

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සාමාන්‍යාධිකාරී/බලයලත් නිලධරයකු විසින් අනුමත කරන ලදී.

අත්සන ෴................................ පදවි නාමය ෴....................... දිනය෴..............................

නිල මුද්‍රාව හෝ අධිකාරියේ මුද්‍රාව

**අවසර පත්‍රයේ නියමයන් හා කොන්දේසි ෴**

1. මෙම අවසර පත්‍රය පැවරිය නොහැකිය.

2. අවසර පත්‍රය දරන්නා මෙම නියෝගවල විධිවිධානවලට අනුකූල විය යුතු ය.

3. අවසර පත්‍ර දරන්නා -

(අ) මෙම නියෝග මගින් ඉටු කිරීමට නියම කරන ලද කර්තව්‍යයන් සහ කාර්යයන් ඉටු කිරීම පැහැර හැර ඇති බවට ; හෝ

(ආ) මෙම නියෝගවල විධිවිධාන උල්ලංඝණය කර ඇති බවට,

අධිකාරිය සෑහීමට පත්ව ඇත්නම් අධිකාරිය විසින් මෙම අවසර පත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

VIII වැනි උපලේඛනය

(8(4) වැනි නියෝගය)

ඉවත දැමීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමෙන් පසුව හෝ අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවන් තුල කලින් කල සෑම අවසර පත්‍ර දරන්නකු විසින්ම, පහත දැක්වෙන තොරතුරුවලින් යුත් වාර්තාවක් අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය.

1. අවසර පත්‍ර අංකය සහ නිකුත් කළ දිනය ;
2. ඉවත දැමීම සිදුකිරීමේදී සම්බන්ධ වූ යාත්‍රාවේ හෝ ගුවන් යානයේ කපිතාන්වරයාගේ නම ;
3. සත්‍ය වශයෙන්ම ඉවත දමන ලද ද්‍රව්‍යවල ප්‍රමාණය සහ ඉවත දමන ස්ථානයේ නිශ්චිත පිහිටීම ;
4. අවසර පත්‍රයේ කොන්දේසි වලින් බැහැරවීමේ කාරණයන් පිළිබඳ සටහන් සහ පැහැදිලි කිරීම් ;
5. අවසර පත්‍රයේ කොන්දේසි යටතේ ඉල්ලා සිටින ලද වැඩිදුරටත් වූ තොරතුරු.

………………………

අවසර පත්‍ර දරන්නාගේ අත්සන.

දිනය:………………………

07-388

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.